| විභාග අංකය : |
|---|
| |

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍යය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2016

ජනවාරි/ පෙබරවාරි - 2022

**BMGT E 1035 - ව්‍යාපාර ආර්ථික විද්‍යාව**

කාලය : පැය 03 යි

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය A කොටස, B කොටස සහ C කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විතය.
- A කොටස අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සඳහා වඩාත්ම යෝග්‍ය පිළිතුර තෝරාගෙන එය මෙම පිළිතුරු පත්‍රයේම යටින් ඉරක් ඇඳ සලකුණු කරන්න. තවද ප්‍රශ්න පත්‍රයේ A කොටස විභාග ශාලාවෙන් පිටතට රැගෙනයාම සපුරා තහනම්ය.
- B කොටසෙහි හා C කොටසෙහි රචනා ශෛලියේ ප්‍රශ්න පහක් (05) ඇතුලත් වන අතර B කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) සහ C කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න එකක් (01) තෝරාගෙන ලබා දී ඇති පොත් පිංචෙහි පිළිතුරු සපයන්න.
- ජංගම දුරකථන, ස්මාර්ට් පරිගණක හෝ වෙනත් අංකිත උපාංගයන් භාවිතා කිරීම තහනම් වේ.
- මුළු ලකුණු 100%.

## A කොටස

01. ආර්ථික පද්ධතියක් තුළ තීරණ ගනු ලබන ප්‍රධාන කණ්ඩායම් තුන වනුයේ,

    අ) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ බැංකු වේ.

    ආ) කුටුම්බ, ව්‍යාපාරික ආයතන සහ රජය වේ.

    ඇ) ව්‍යාපාරික ආයතන, රජය සහ රාජ්‍ය නොවන සංවිධාන වේ.

    ඈ) ව්‍යාපාරික ආයතන, බැංකු සහ විදේශ වෙළෙඳාමේ නිරත වූවන් වේ.

| විභාග අංකය : |
|---|
| |

02. පහත සඳහන් ප්‍රකාශන අතුරෙන් සූක්ෂම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශනයක් වන්නේ කවරක්ද?

අ) පසුගිය වසරේ දී තේ මිල 15% කින් පහළ වැටුණි.

ආ) පසුගිය වසරේ දී විරැකියාව ශ්‍රම හමුදාවෙන් 6% ක් වූයේ ය.

ඇ) පසුගිය වසරේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 7% කින් ඉහළ ගියේය.

ඈ) පසුගිය වසරේ දී රජයේ බදු අයභාරය 9% කින් අඩු විය.

03. බොහෝ පරිභෝජන කටයුතු වල දී බටර් සහ මාජරින් එකිනෙකට ආදේශක වශයෙන් සැලකේ. බටර් මිල ඉහළ ගියහොත්,

අ) බටර් ඉල්ලුම වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.

ආ) බටර් ඉල්ලුම අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.

ඇ) බටර් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වෙතැයි අපේක්ෂා කෙරේ.

ඈ) බටර් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ.

04. ජගත්ගේ ආදායම සතියකට රුපියල් 940 සිට සතියකට රුපියල් 1060 දක්වා වැඩි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සතියකට 12% ක් වැඩිපුර බිස්කට් මිලදී ගැනීමට ඔහු තීරණය කරයි. ජගත්ගේ බිස්කට් සඳහා වන ඉල්ලුමේ ආදායම් ඉල්ලුම් නම්‍යතාවය වන්නේ,

අ) 1.33

ආ) 0.90

ඇ) 1.00

ඈ) 0.75

05. භාණ්ඩ X සහ Y පරිපූර්ණ ආදේශක වේ. මෙම භාණ්ඩ සඳහා පාරිභෝගිකයාගේ උපේක්ෂා වක්‍රය නියෝජනය කරන්නේ,

අ) ඉහළට බෑවුම් සහිත සරල රේඛාවකින්

ආ) මූලයට උත්තල වන ඉහළට බෑවුම් වක්‍රයකින්

ඇ) පහළට බෑවුම් සහිත සරල රේඛාවකින්

ඈ) මූලයට උත්තල වන පහළට බෑවුම් වක්‍රයකින්

| විභාග අංකය : |
|---|
| |

06. හීනවන ඵලදා නීතිය ප්‍රකාශ කරනුයේ,

අ) කර්මාන්ත ශාලාවේ විශාලත්වය වැඩිකරන විට, එහි ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටෙන බවය.

ආ) කර්මාන්ත ශාලාවේ විශාලත්වය වැඩි කරන විට එහි සාමාන්‍ය පිරිවැය ක්‍රමයෙන් පහළ වැටෙන බවය.

ඇ) ආයතනය ස්ථාවර යෙදවුම් ප්‍රමාණයක් සමඟ විචල්‍ය යෙදවුම් වැඩි වැඩියෙන් භාවිත කරන විට, එහි ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටන බවය.

ඈ) ආයතනය ස්ථාවර යෙදවුම් ප්‍රමාණයක් සමඟ විචල්‍ය යෙදවුම් වැඩි වැඩියෙන් භාවිත කරන විට එහි ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටෙන බවය.

07. ආයතනයක කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතයෙහි ආන්තික ඵලදාව ශූන්‍ය වන විට,

අ) මුළු ඵලදාව උපරිම වේ.

ආ) සාමාන්‍ය ඵලදාව උපරිම වේ.

ඇ) ආන්තික ඵලදාව අවම වේ.

ඈ) ආන්තික ඵලදාව සාමාන්‍ය ඵලදාවට සමාන වේ.

08. සම නිෂ්පාදන වක්‍රයකින් නිරූපණය වන්නේ,

අ) ස්ථාවර මට්ටමේ ලාභයක් ඉපැයීමට අවශ්‍ය යෙදවුම් සංයෝජන

ආ) ස්ථාවර ප්‍රාග්ධන ප්‍රමාණයක් පවත්වා ගැනීමට අවශ්‍ය ශ්‍රම සංයෝජනය

ඇ) ස්ථාවර නිමැවුම් ප්‍රමාණයක් නිපදවීමට අවශ්‍ය යෙදවුම් සංයෝජන

ඈ) ස්ථාවර පිරිවැය දැරීමට අවශ්‍ය යෙදවුම් සංයෝජන

09. එක්තරා ආයතනයක නිමැවුම ශූන්‍ය වන විට, මුළු පිරිවැය රුපියල් 600 ක් වේ. ඒකක 5 ක් නිෂ්පාදනය කරන විට මුළු පිරිවැය රුපියල් 1,260 ක් වේ. ඒකක 5 ක් නිෂ්පාදනය කරන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය කොපමණද?

අ) රුපියල් 120

ආ) රුපියල් 132

ඇ) රුපියල් 244

ඈ) රුපියල් 660

10. පූර්ණ තරඟකාරී ආයතනයක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් වන්නේ,

අ) වෙළෙඳ පොළේ සමජාතීය භාණ්ඩ අලෙවි කරන බැවිනි.

ආ) සැපයුම්කරු මිල තීරකයකු බැවිනි.

ඇ) සැපයුම්කරු මිල ගනුවකු බැවිනි.

ඈ) සැපයුම්කරුට අවශ්‍ය තොරතුරු නොලැබෙන බැවිනි.

විභාග අංකය ෑ

11. පූර්ණ තරඟකාරී කර්මාන්තයක් සඳහා වෙළඳපල ඉල්ලුම් වක්‍රය Qd = 12 - 2P වේ. වෙළඳපල සැපයුම් වක්‍රය Qs = 3 + P. වෙළඳපල සමතුලිත මිල සහ ප්‍රමාණය වන්නේ,

අ) P = 6 සහ Q = 9

ආ) P = 5 සහ Q = 2

ඇ) P = 4 සහ Q = 4

ඈ) P = 3 සහ Q = 6

12. ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් පැවතිය හැක්කේ පහත සඳහන් කවර වෙළෙඳපල තුළද?

අ) පූර්ණ තරඟකාරී වෙළඳපලක් තුල

ආ) ඒකාධිකාරී තරඟ වෙළඳපල තුල

ඇ) ඒකාධිකාරී වෙළඳපලක් තුල

ඈ) කතිපයාධිකාරී වෙළඳපලක් තුල

13. ඒකාධිකාරී නිෂ්පාදකයෙකු නිමැවුම් ඒකක 14,000 ක් නිෂ්පාදනය කරන අතර ඒකකයකට රුපියල් 14 ක් අය කෙරේ. එහි ආන්තික ආදායම රුපියල් 8 ක් වන අතර, එහි ආන්තික පිරිවැය රුපියල් 7 ක් වේ. එහි සාමාන්‍ය පිරිවැය රුපියල් 10 ක් වන අතර, එහි සාමාන්‍ය විචල්‍ය පිරිවැය රුපියල් 9 කි.

ඒ අනුව ඒකාධිකාරී ආයතනය විසින් කල යුත්තේ,

අ) නිෂ්පාදනය වැඩි කිරීම, එය සමාගමේ ධනාත්මක ආර්ථික ලාභයේ වැඩිවීමක් ඇති කරයි.

ආ) නිෂ්පාදනය වැඩි කිරීම, එය සමාගමේ ආර්ථික පාඩු අවම කරනු ඇත.

ඇ) වසා දැමීම, සමාගමේ ආර්ථික පාඩු අවම කරනු ඇත.

ඈ) නිෂ්පාදනය අඩු කිරීම, එය සමාගමේ ධනාත්මක ආර්ථික ලාභයේ වැඩිවීමක් ඇති කරයි.

14. ඒකාධිකාරී තරඟය නැමැති වෙළඳපොළ ව්‍යුහයෙහි,

අ) දක්නට ලැබෙනුයේ එක් නිෂ්පාදන ආයතනයක් පමණි.

ආ) දක්නට ලැබෙනුයේ නිෂ්පාදන ආයතන සුළු ප්‍රමාණයකි.

ඇ) සමජාතීය වූ භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතන විශාල සංඛ්‍යාවක් ඇත.

ඈ) ප්‍රභේදනය වූ භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතන විශාල සංඛ්‍යාවක් ඇත.

15. ආදායමේ චක්‍රීය ප්‍රවාහ ආකෘතිය තුළ ඇතුළත් මූර්ත ප්‍රවාහ අතුරෙන් එකක් වන්නේ,

අ) ආයතන වෙතින් කුටුම්බ කරා ඇදෙන භාණ්ඩ හා සේවා ප්‍රවාහය යි.

ආ) ආයතන වෙතින් කුටුම්බ කරා ඇදෙන සේවා ප්‍රවාහය යි.

ඇ) කුටුම්බ වෙතින් ආයතන කරා ඇදෙන භාණ්ඩ හා සේවා ප්‍රවාහය යි.

ඈ) ආයතන වෙතින් කුටුම්බ කරා ගලා යන මුදල් ගෙවීම් ප්‍රවාහය යි.

| විභාග අංකය : |
|---|
| |

16. බෑග් නිෂ්පාදකයෙකු රු. 2000 ක් වටිනා සම් සහ රු. 250 ක් වටිනා නූල් මිලට ගත් අතර, ඉන් සම් බෑග් නිෂ්පාදනය කිරීමෙන් පසු ඔහු එකක් රු. 9000 කට පරිභෝගිකයන් සඳහා විකුණුවේය. දළ දේශීය නිෂ්පාදිතයට බෑග් නිෂ්පාදකයාගේ දායකත්වය වන්නේ,
    - අ) රුපියල් 2,250 කි.
    - ආ) රුපියල් 6,750 කි.
    - ඇ) රුපියල් 9,000 කි.
    - ඈ) රුපියල් 11,250 කි.

17. 2021 දී රටක නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයක් 8% ක් වූ අතර සැබෑ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 4% ක් විය. මේ රටේ උද්ධමනය කොපමණද?
    - අ) - 4%
    - ආ) 2%
    - ඇ) 4%
    - ඈ) 8%

18. සරල කේන්සියානු ආකෘතියේ ස්වයංක්‍රීය පාරිභෝගික වියදම්වල වැඩිවීමක්, සමාහාර ඉල්ලුම් ශ්‍රිතය (1)_________ විතැන් කිරීමටත්, සමස්ථ නිමැවුමේ සමතුලිතතා මට්ටම ඉහළ යාමටත්, IS වක්‍රය (2)_________ මාරු වීමටත් හේතු වේ.
    - අ) ඉහළට, වමට
    - ආ) ඉහළට, දකුණට
    - ඇ) පහළට, වමට
    - ඈ) පහළට, දකුණට

19. පොලී අනුපාත නියම කිරීමේදී මහ බැංකුවට මුහුණදීමට සිදුවන ගැටලුව කුමක්ද?
    - අ) පොලී අනුපාත සැකසීම ගැටලු සහගත නොවේ.
    - ආ) විනිමය අනුපාතය ද නියම කළ යුතුය.
    - ඇ) කලින් ණය ආපසු ලබාගත යුතුය.
    - ඈ) ඉල්ලා සිටින සියලුම ද්‍රවශීලතා අවශ්‍යතා සැපයිය යුතුය.

20. පහත සඳහන් ප්‍රකාශ වලින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
    - අ) විරැකියා අනුපාතය, විරැකියාවේ කාලසීමාව ගැන අපට කිසිවක් නොකියයි.
    - ආ) අවපාත කාලය තුළ විරැකියාවේ කාලසීමාව අඩු වේ.
    - ඇ) ආර්ථික ප්‍රසාරණය අතරතුර විරැකියාවේ කාලසීමාව වැඩිවේ.
    - ඈ) විරැකියාවේ මධ්‍ය කාලය සාමාන්‍යයෙන් විරැකියාවේ සාමාන්‍ය කාල සීමාවට වඩා වැඩිය.

**(2 x 20 = ලකුණු 40)**

## B කොටස

ප්‍රශ්න අංක 01

අ) ශ්‍රී ලංකාවේ දිගු කාලීන ආර්ථික වෘද්ධිය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි ගෝලීය ආර්ථිකයේ වර්තමානයේ සිදුවන වෙනස්කම් කෙටියෙන් සඳහන් කරන්න.

(ලකුණු 05 යි)

ආ) කල්පිත ආර්ථිකයක පොල් ගෙඩියක මිල සහ පොල් සැපයුමේ ප්‍රමාණය පහත පරිදි වේ.

| පොල් ගෙඩියක මිල (රු.) | පොල් ගෙඩි සැපයුම් ප්‍රමාණය (Qs) |
|---|---|
| 20 | 0 |
| 30 | 200 |
| 40 | 400 |
| 50 | 600 |
| 60 | 800 |
| 70 | 1000 |

පොල් සැපයුම සඳහා සැපයුම් සමීකරණය $Qs = a + bP$ වේ.

i) b හි අගය සොයන්න.

ii) a හි අගය සොයන්න.

iii) a සහ b හි අගයන් ඉහත සමීකරණයට ආදේශ කරන්න.

(ලකුණු 07 යි)

ඇ) A, B, C හා D යන රටවල් 4 ක ආර්ථිකවල පහත වෙනස්කම් සිදුවී ඇත.

(i) A ආර්ථිකයේ නිෂ්පාදන හැකියා වක්‍රය 2020 - 2025 කාලය තුළ දකුණට විතැන්වීම.

(ii) B ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව නොවෙනස්ව තිබියදී නිෂ්පාදන මට්ටම වැඩි වීම.

(iii) C ආර්ථිකයේ නිෂ්පාදන හැකියා වක්‍රය 2020 - 2025 කාලය තුළ ඇතුලට විතැන්වීම.

(iv) D ආර්ථිකයේ නිෂ්පාදන හැකියාව නොවෙනස්ව තිබිය දී නිෂ්පාදන මට්ටම හැකියා වක්‍රය මත සිට වක්‍රය ඇතුළත ලක්ෂ්‍යයක් වෙත මාරුවීම.

ඉහත එක් එක් සිදුවීම, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මගින් නිරූපණය කර එම සිදුවීම කෙරෙහි බලපාන සාධක දෙක බැගින් දක්වන්න.

(ලකුණු 08 යි)

**(මුළු ලකුණු 20 යි)**

ප්‍රශ්න අංක 02

ආ) පාරිභෝගික සමතුලිතය නිෂ්පාදිත සමතුලිතයෙන් වෙන්කර ගෙනහැර දක්වන්න.

(ලකුණු 08)

ආ) පූර්ණ තරඟකාරී වෙළෙඳපලක ඉල්ලුම් වක්‍රය ඒකාධිකාරී තරඟ වෙළෙඳපලක ඉල්ලුම් වක්‍රයකින් වෙනස්වන්නේ කෙසේදැයි හේතුන් සමඟ විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ) හීනවන ඵලදා නීතිය හා පරිමාණානුකූල ඵල නීතිය නිෂ්පාදන ආයතනයක නිෂ්පාදන පිරිවැය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) "සාමාන්‍ය විචල්‍ය පිරිවැයවත් ගෙවීමට නොහැකිනම් පූර්ණ තරඟකාරී සමාගමක් කෙටි කාලයේදී වසා දැමිය යුතුය". ප්‍රස්ථාර භාවිතයෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ආ) එක්තරා ආයතනයක ඉල්ලුම් හා මුළු පිරිවැය ශ්‍රිතයන් පහත පරිදි දක්වා ඇත;

$P = 200 + 2Q$

$TC = 25 + 4Q^2$

I. ආයතනයේ ලාභ උපරිම වන මිල හා නිමැවුම තීරණය කරන්න.

II. ලාභය කොපමණද යන්න ගණනය කරන්න.

(ලකුණු 06)

ඇ) "ඒකාධිකාරයක්, පූර්ණ තරඟකාරී වෙළඳපලට වඩා කුඩා නිමැවුමක් නිපදවන අතර පූර්ණ තරඟකාරී වෙළඳපොළට වඩා ඉහළ මිලක් අය කරයි". ප්‍රස්තාරය භාවිතයෙන් මෙම ප්‍රකාශය විස්තර කරන්න.

(ලකුණු 07)

**(මුළු ලකුණු 20)**

## C කොටස

ප්‍රශ්න අංක 04

අ) "ද්විත්ව ගණන දෝෂ නිසා ජාතික ආදායම වැරදි ලෙස ගණනය කළ හැක". මෙම ප්‍රකාශය විස්තර කර මෙම ගැටලුව මගහරවා ගන්නේ කෙසේද යන්න සඳහන් කරන්න.

(ලකුණු 06)

ආ) කෘෂිකාර්මික සමාගමක් වන A සමාගම තිරිඟු බීජ වගා කර රුපියල් 100 ක මුදලකට B සමාගමට අලෙවි කරයි. පිටි සමාගමක් වන B සමාගම තිරිඟු බීජ තිරිඟු පිටි බවට සකසයි. පසුව එම සමාගම එය පාන් නිෂ්පාදකයකු වන C සමාගමට රු. 250කට අලවි කරයි. C සමාගම අවසානයේ පාරිභෝගිකයින්ට පාන් විකුණනු ලබන්නේ රු. 300ක මිලකටය. අවසාන නිමැවුමමේ අගය ගණනය කරන්න.

(ලකුණු 04)

1. උපකල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් ඔබට පහත දත්ත ලබා දී ඇතැයි සිතන්න.

| අයිතමය | වටිනාකම (රු. මිලියන) |
|---|---|
| ස්වයං රැකියාලාභීන්ගේ ආදායම | 8000 |
| ක්ෂය වීම | 200 |
| ලාභය | 1000 |
| කුලිය | 600 |
| ශුද්ධ පොලී | 700 |
| සේවකයින්ගේ වැටුප් | 3000 |
| ශුද්ධ වක්‍ර බදු | 500 |
| විදේශ ශුද්ධ සාධක අදායම | 60 |
| ශුද්ධ අපනයන | -50 |
| විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම | 20 |

පහත දෑ ගණනය කරන්න.

1. දේශීය ආදායම (ලකුණු 04)
2. දළ ජාතික ආදායම (ලකුණු 02)
3. වෙළඳපල මිලට දළ ජාතික නිෂ්පාදිතය (ලකුණු 02)
4. වැය කල හැකි ජාතික අදායම (ලකුණු 02)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 05

ටැන්සානියාව සංවෘත ආර්ථිකයක් ඇති රටක් වන අතර කෙටිකාලීන IS-LM ආකෘතිය හා සම්බන්ධ වේ. එය භාණ්ඩ වෙළෙඳපලේ සහ මුදල් වෙළෙඳපලේ සමතුලිතතාවයන් පිළිබඳව සැලකිලිමත් වේ. ඒ අනුව ටැන්සානියානු ආර්ථිකය පහත සමීකරණ මාලාවක් මඟින් විස්තර කෙරේ.

<u>භාණ්ඩ වෙළෙඳපල</u>

C = c0 + c1(1-t)Y,

C යනු පාරිභෝජනය; Y යනු ආදායමයි; t සමානුපාතික බද්දක් නියෝජනය කරයි; සහ c0 සහ c1 ධන නියතයන් වේ.

I = b0 - b1i, I යනු ආයෝජනයයි; i පොලී අනුපාතය; සහ b0 සහ b1 ධන නියතයන් වේ.

G = G, G යනු ධන නියතයකි.

<u>මුදල් වෙළෙඳපල:</u>

Md = (Mt+Msp), Md යනු මුදල් ඉල්ලුම; Mt යනු ගණුදෙනු චේතනාව වන අතර Msp යනු සමපේක්ෂන චේතනාවයි.

Ms මඟින් මුදල් සැපයුම නියෝජනය වේ.

අ) IS සහ LM වක්‍රය නිර්වචනය කර, භාණ්ඩ වෙළෙඳපල සහ මුදල් වෙළෙඳපල සමීකරණ ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 05)

ආ) රජය සිය වියදම් $\Delta G$ ප්‍රමාණයකින් වැඩි කරන්නේ යැයි සිතමු. එහි බලපෑම කුමන වක්‍රය මතද? සහ එහි ආර්ථික බලපෑම් මොනවාද? මෙම ප්‍රතිපත්තියේ බලපෑම පෙන්වන රූප සටහනක් අඳින්න.

(ලකුණු 05)

ඇ) වියදම් වැඩි කරනවා වෙනුවට බදු අඩු කිරීමට රජය තීරණය කරන්නේ යැයි උපකල්පනය කරමු. රූප සටහනක් භාවිතයෙන් මෙම ප්‍රසාරණාත්මක මූර්ත ප්‍රතිපත්තියේ බලපෑම් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 05)

ඈ) IS-LM ආකෘතිය භාවිතා කරමින් මුදල් සැපයුම පුළුල් කිරීමට රජය තීරණය කලහොත් ආර්ථිකයට ඇතිවිය හැකි බලපෑම කුමක්ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**